# <u>මීගමුව මහ නගර සභාව</u>
# <u>2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම</u>

මීගමුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් 2026 වර්ෂය සඳහා පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සැපයීම පිණිස ලියාපදිංචි වීමට කැමති සුදුසුකම්ලත් පිලිගත් අයදුම්කරුවන්ගෙන්, නිෂ්පාදකයින්ගෙන් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍ර නිකුත් කිරීම- 2025.10.16 සිට 2025.10.31 දක්වා රජයේ වැඩ කරන දින වල පෙ.ව. 9.00 සිට ප.ව. 03.00 දක්වා නාගරික ගණකාධිකාරී දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.අයදුම්පත්‍රය ලබා ගන්නා අවස්ථාවේදීම ලියාපදිංචි කිරීම ආකෘති පත්‍ර ගාස්තුව හා ලියාපදිංචි ගාස්තුව ගෙවීම කළ යුතුය.

නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් මුදල් තැන්පත් කළ ලදුපත සමඟ 2025.11.07 දින ප.ව. 3.00 ට පෙර පහත ලිපිනයට එවිය යුතුය. අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරේ "සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2026" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් හෝ සභාව වෙත ගෙනැවිත් බාර දිය හැකිය.

ලිපිනය - නාගරික කොමසාරිස්,මහා නගර සභාව,මීගමුව

නගර සභාවට ගෙවන සෑම ගෙවීමක්ම රජය විසින් වරින් වර පනවනු ලබන බදු ගෙවීම්වලට යටත් වේ..

එක් එක් අයිතම වෙනුවෙන් වෙන වෙනම ලියාපදංචි වීමේ ගාස්තු ගෙවිය යුතු අතර, "නාගරික කොමසාරිස්, මීගමුව" නමින් ලියන ලද මුදල් ඇණවුමක්/ බැංකු අණකරයක් මඟින් හෝ මුදල් ගෙවීම් කළ හැකිය. චෙක්පත් භාරගනු නොලැබේ.

| අයිතමය | මුදල |
|---|---|
| ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍ර ගාස්තුව | 100.00 + 18% VAT |
| ලියාපදිංචි ගාස්තුව (ආපසු නොගෙවන), ඉදිකිරීම් කොන්ත්‍රාත්තු හැර | 3,000.00 + 18% VAT |
| ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සඳහා ලියාපදිංචි වීමේ ගාස්තුව | 7,500.00 + 18% VAT |

<u>කොන්දේසි</u> -

- ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි වී තිබිය යුතුය.( ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කළ පිටපතක් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.)
- VAT සඳහා ලියාපදිංචි වී ඇත්නම් ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපතක් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.
- රජයේ ප්‍රසම්පාදන(භාණ්ඩ හා වැඩ)අංක 10.4 දරණ වගන්තිය ප්‍රකාරව කොන්දේසි පැහැර හැරි සැපයුම්කරුවන් හෝ කොන්ත්‍රාත්කරුවන්ට ලියාපදිංචිය සඳහා අවසර නොමැත.
- කොන්ත්‍රාත්කරුවන් සඳහා ලියාපදිංචි වන අයදුම්කරුවන් විසින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි සහතික ඇති ආයතන හෝ පුද්ගලයන් විය යුතුය.

- වාහන නඩත්තු සේවා හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි වීමේදී නාගරික ඉංජිනේරු නිර්දේශය මත සිදු කරනු ලබයි.
- ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලබන අතර අවස්ථානුකූලව ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් බැහැරව භාණ්ඩ හා සේවා ලබා ලැනීම සඳහා සැපයුම්කරුවන් තෝරා ගැනීමේ සම්පූර්ණ අයිතිය සභාව සතු වේ.
- විවිධ භාණ්ඩ හා සේවා සැපයීම සඳහා නියමිත පරිදි සැපයුම්කරුවන් තොරා ගැනීමේ අධිකාරිය සභාව සතු වේ.
- දැනුම් දීමක් කිරීමෙන් පසුව නියමිත පරිදි මිල ගණන් ඉදිරිපත් කිරීමෙන් පිලිගෙන ඇති මිල ගණන් වලට හා ප්‍රමිතීන්ට අනුකූලව භාණ්ඩ සැපයීමට අසමත් වන අයදුම්කරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබේ.
- මිල ගණන් ඉදිරිපත් කිරමෙන් පසු සැපයීමට අවශ්‍ය පරිදි ප්‍රමාණවත් තොග තබා ගැනීම සැපයුම්කරුවන් විසින් කළ යුතුය.
- භාණ්ඩ සැපයීම සම්බන්ධයෙන් වැඩිමනක් කොන්දේසි පැනවීම අවශ්‍ය යැයි පෙනී ගියහොත් එසේ කිරීමේ අයිතිය සභාව සතුවේ.
- ලියාපදිංචි කිරීමෙන් පසුව කවර කරුණක් යටතේ වුවද කාණ්ඩ වර්ගයෙහි කිසිදු වෙනසක් කළ නොහැකි බව හා කාණ්ඩ අතර මාරු කිරීම සිදු නොකරණ බව සලකන්න.
- අයදුම්කරුවන් ඉදිරිපත් කරණු ලබන ලේඛණ වල සාවද්‍ය බව මත පෙර දැණුම් දීමකින් තොරවම ලියාපදිංචිය අවලංගු කෙරේ.එසේම කිසිදු අයුරකින් මුදල් ආපසු ගෙවීම සිදු නොකරන බවද සලකන්න.
- භාණ්ඩ හා සේවා සැපයීම කළ පසු අවම වශයෙන් දින 60ක ණය පහසුකම් සැපයීමට සියළු සැපයුම්කරුවන් ස්වයංක්‍රීයවම එකඟවනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- වැඩිදුර විස්තර 031-2281987 දරණ දුරකථන අංකයෙන් ප්‍රධාන නාගරික ගණකාධිකාරි අමතා විමසා දැන ගත හැකිය.
- අදාල භාණ්ඩ සඳහා ගාස්තු ගෙවා එහෙත් ලියාපදිංචි නොවන කවරෙකු හෝ වෙතොත් එම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.
- ලියාපදිංචියෙන් පසු කොන්දේසි උල්ලංඝනය කිරීම සැපයුම්කරුගේ හෝ කොන්ත්‍රාත්කරුගේ නම ලියාපදිංචි ලේඛණයෙන් ඉවත් කිරීමට හේතු වේ.
- නාගරික කොමසාරිස් විසින් පත් කරන කමිටුවක් මගින් පරීක්ෂාවකට ලක්කර භාණ්ඩ හෝ සේවා සැපයීම පිළිබඳ ධාරිතා නිර්දේශයක් ලබා ගැනීම හා එම කමිටුව මගින් නිර්දේශ නොකරණ ආයතන ලියාපදිංචි නොකිරීම සිදු කරයි.

## ලියාපදිංචි කර ගන්නා භාණ්ඩ සැපයුම් හා සේවාවන් අයිතම ලැයිස්තුව - 2026

### A - භාණ්ඩ සැපයීම

| අයිතම අං. | විස්තරය | අයිතම අං. | විස්තරය |
|---|---|---|---|
| A 01 | කාර්යාල ලී බඩු හා වානේ භාණ්ඩ | A 16 | ගංගා වැලි (බලපත්‍රහිමියන් විය යුතුය) |
| A 02 | පරිගණක හා පරිගණක උපාංග, මුද්‍රණ යන්ත්‍ර හා ඡායා පිටපත් යන්ත්‍ර | A 17 | පස් හා බොරළු (බලපත්‍රහිමියන් විය යුතුය) |
| A 03 | ඇඟිලි සලකුණු යන්ත්‍ර හා වෙනත් විද්‍යුත් උපකරණ | A 18 | පෙර මිශ්‍රිත කොන්ක්‍රීට් |

| | | | |
|---|---|---|---|
| A 04 | වායුසමීකරණ යන්ත්‍ර | A 19 | ඇස්පොල්ට් හා කෝල්ඩ් මික්ස් |
| A 05 | විදුලි භාණ්ඩ | A 20 | ගෑස් හා ඉන්ධන |
| A 06 | කාර්මික උපකරණ හා යාන්ත්‍රික උපකරණ | A 21 | තාර හා කෝලාස් |
| A 07 | තිර රෙදි හා බුමුතුරුණු | A 22 | මෝටර් රථ හා ට්‍රැක්ටර් අමතර කොටස් |
| A 08 | නිල ඇඳුම් හා සපත්තු | A 23 | බැටරි(වාහන සඳහා) |
| A 09 | ක්‍රීඩා භාණ්ඩ | A 24 | ටයර් සහ ටියුබ් |
| A 10 | ලිපිද්‍රව්‍ය හා කඩදාසි | A 25 | ග්‍රීස් හා ලිහිසි තෙල් |
| A 11 | ආරක්ෂක උපකරණ | A 26 | සනීපාරක්ෂක ද්‍රව්‍ය |
| A 12 | මුද්‍රණ කටයුතු, බැනර් හා ස්ටිකර් මුද්‍රණය හා සමරු ඵලක නිර්මාණය | A 27 | කොම්පෝස්ට් බදුන් , කසල බදුන් හා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයට අවශ්‍ය උපකරණ |
| A 13 | හාඩ්වෙයාර් භාණ්ඩ | A 28 | කෘමිනාශක හා කෘමිනාශක උපකරණ (බලපත්‍රහිමියන් විය යුතුය) |
| A 14 | ලී, ලෑලි හා දැව | A29 | පශු  වෛද්‍ය උපකරණ හා වෛද්‍ය සැපයුම්,බෙහෙත් ද්‍රව්‍ය |
| A 15 | කළුගල් | A30 | කුට්ටිගල් |

## B - සේවාවන් සැපයීම

| අයිතම අං. | විස්තරය |
|---|---|
| B 01 | ගොඩනැගිලි, මාර්ග නඩත්තු වැඩ කිරීම හා ඉදිකිරීම් කොන්ත්‍රාත් කිරීම. |
| B 02 | මෝටර් වාහන හා බර යන්ත්‍රෝපකරණ නඩත්තුව හා අළුත්වැඩියාව, වාහන විදුලි කාර්මික සේවාව, ට්‍රැක්ටර්, බේලර් යන්ත්‍ර, රොටරි ස්ලෑෂ්, ගිනි නිවීම් පොම්ප අළුත්වැඩියා කිරීම. |
| B 03 | ටයර් සහ ටියුබ් පැච් දැමීම. |
| B 04 | කාර්යාල ලී බඩු, පරිගණක පුටු, විධායක පුටු, වානේ කැබිනට්, අල්මාරි නඩත්තුව හා අළුත්වැඩියා කිරීම. |
| B 05 | පරිගණක, UPS යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ඇඟිලි සලකුණු යන්ත්‍ර, මුදල් ගණන යන්ත්‍ර නඩත්තුව හා අළුත්වැඩියා කිරීම. |

| | |
|---|---|
| B 06 | විදුලි භාණ්ඩ, කාර්මික හා යාන්ත්‍රික උපකරණ, ධූමායන යන්ත්‍ර, තණකොල කපන යන්ත්‍ර නඩත්තුව හා අළුත්වැඩියා කිරීම. |
| B 07 | වායු සමීකරණ යන්ත්‍ර නඩත්තුව හා අළුත්වැඩියා කිරීම. |
| B 08 | ශ්‍රමය සැපයීම. |
| B 09 | පුවත්පත් දැන්වීම් පළ කිරීම, බැනර් හා ස්ටිකර් මුද්‍රණය කිරීම, දැන්වීම් පුවරු සකස් කිරීම, LED ප්‍රචාරක පුවරු සකස් කිරීම. |
| B10 | සම්මන්ත්‍රණ හා උත්සව සඳහා අහාර පාන සැපයීම. |
| B 11 | උත්සව භාණ්ඩ, විදුලි ආලෝක, ශබ්ද විකාශන සේවා සැපයීම. |
| B 12 | රක්ෂණ සේවා කටයුතු සිදුකිරීම. (ගොඩනැගිලි, වාහන, යන්ත්‍රෝපකරණ හා සේවක) |
| B 13 | අභ්‍යන්තර දුරකථන පද්ධති සේවා සැපයීම හා නඩත්තු කිරීම. |
| B 14 | විද්‍යුත් පඩිපෙළ, විදුලි ජනන යන්ත්‍ර නඩත්තුව හා අළුත්වැඩියා කිරීම. |
| B 15 | පරිගණක ජාලකරණය, ආවේක්ෂණ කැමරා පද්ධති, පරිගණක පද්ධති සේවා (කාර්යාලීය, පුස්තකාල) සැපයීම හා නඩත්තු කිරීම. |
| B 16 | උද්‍යාන අලංකරණය හා අභ්‍යන්තර පරිශ්‍ර අලංකරණය කිරීම. |
| B 17 | නාගරික බල ප්‍රදේශයේ අනතුරුදායක ගස් හා අතු කපා ඉවත් කිරීම. |

නාගරික කොමසාරිස්,
මහා නගර සභාව ,
මීගමුව.